## එළදාව විකිණීමේ දී




වෙනත් ගොවි නිෂ්පාදන වලට වඩා වැඩි මිලකට ඔබේ නිෂ්පාදන ගොවිපළටම ඇවිත් මිල දී ගන්න අලෙවිකරුවන් සූදානම්

## පාරිභෝගිකයින්ට



GAP ලේබලය සහිත නම් ගුණාත්මය සහතිකයි
සුපිරි වෙළඳසැල්වල GAP නිෂ්පාදන අලෙවියට වෙනම කවුළුවකුත් විවෘත වෙලා

**වැඩිදුර තොරතුරු මෙතැනින්**

**1920 කෘෂි උපදේශන සේවය**
**කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය**
**දුරකතන අංකය - 0812 388 754/ 0812 388 465**


*තාක්ෂණික දායකත්වය* : ඒ.එස්.එම් රොෂාන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)
*පිටපත* : සනත් එම් බණ්ඩාර (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)
*සැකසුම* : ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව
*මුද්‍රණය* : කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව


අපි එදා GAP කිව්වේ හිදැසකට....

හැබැයි දැන් අපි GAP කියනකොට යහපත් කෘෂි පිළිවෙත් වෙනවා

# GOOD AGRICULTURE PRACTICES

# GAP කාටද ?



ගොවියාට....
පාරිභෝගිකයාට....
පොදුවේ රටටම....



පිටරට වෙළඳපොළට
ගැලපෙන්නයි පටන් ගත්තේ
දැන් ඒ ප්‍රතිලාභය
**දේශීය වෙළඳපොළටත්**
ලැබෙනවා

රෝපණ ද්‍රව්‍ය වල සිට
එළදාව වෙළඳපොළට යන තෙක්
අපි සොයා බලනවා






කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන,
වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි - 2019

# GAP අනුගමනය කළොත්

- නිෂ්පාදන වියදම අඩුවෙනවා
- ගොවියාගේ සෞඛ්‍ය රැකෙනවා
- ගොවිපළ ලස්සනයි වැඩකරන්න ආසා හිතෙනවා
- වස විස නැති ආහාර නිපදවෙනවා
- **ලැබෙන ඵලදාවට හොඳ මිලකුත් ලැබෙනවා**

**ඔබගේ ගොවිපළට GAP සහතිකය ලැබෙන්නේ නොමිලේ !**

## GAP ගොවිපළක් වීමට නම්




# ගොවියාගේ වගකීම කෙබඳු ද



**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලබාදෙන GAP සම්මුතීන්ට එකඟ විය යුතුයි.**

- ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම භාවිතා කළ යුතුයි
- කෘෂි රසායන භාවිතය අවශ්‍යම නම් හා අවසානයට පමණයි
- කෘෂි රසායන යෙදුවොත් අස්වැන්න නෙළීම ප්‍රවේසම් කාලයෙන් පසුව
- පොහොර යෙදීම පස් පරීක්ෂාකර අවශ්‍ය නම් පමණයි
- නිවැරදි ක්‍රමයට අස්වැන්න නෙළීම හා ගබඩා කිරීම කළ යුතුයි

## බලාගෙනයි....!

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ GAP සහතිකකරණ ඒකකයේ නිලධාරීන් පැමිණ විටින් විට ගොවිපළ අධීක්ෂණය හා කටයුතු විගණනය කරනවා
- ගොවිපළට GAP සහතිකය ලැබෙන්නේ ඔබ සාර්ථක නම් පමණයි
- සහතිකයේ ඇති QR කේතය මගින් ඔබගේ විස්තර ලොවටම කියනවා

